# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2407/35 - 2024 ඔක්තෝබර් මස 25 වැනි සිකුරාදා - 2024.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත

5 වන වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂාංගික විධිවිධාන

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ පළමු වන උප ලේඛනයේ සඳහන් සංස්පර්ශක රෝගයක් වන අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ 2014 ජුනි මස 17 වන දින හා අංක 1867/8 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ සඳහන් වන අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ( PRRS) ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පැතිරී යන බැවින් හා පැතිරීමට ඉඩ ඇති බැවින්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කස්තුරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල වන මා එම පනතෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව,

(1) ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එම පනතේ කාර්යය සඳහා අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ( PRRS) සඳහා ආසාධිත හෝ අවදානම් ප්‍රදේශයන් ලෙස ද,

(2) ඌරන් රෝග අවදානම් සතුන් ලෙසද,

මෙම නියමයෙන් ප්‍රකාශයට පත්කරමි.

(3) මෙම නියමය, *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළ හොත් මිස හෝ එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළහොත් මිස ක්‍රියාත්මක වන දින සිට මාස 03කට නොවැඩි කාලයක් සඳහා වලංගු වන අතර රෝග තත්ත්වය අනුව කාලය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා,

(1) ඇති වී තිබෙන අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ සූකර අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ආසාධිත හා අවදානම් ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි.

1A - G42951 - 54 (2024/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(i) සත්ත්ව රෝග පනතේ 5 (4) වගන්තිය යටතේ සියලුම අවදානම් සහිත ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හෝ රෝග කාරක ද්‍රව්‍ය අසාදිත හෝ අවදානම් ප්‍රදේශය තුළ හෝ ප්‍රදේශයෙන් පිටතට ප්‍රවාහනය කිරීම, ඉවත් කිරීම, රැගෙන යාම හෝ පලවා හැරීම,

(ii) ආසාධිත සතුන් ඝාතනය කිරීම,

(iii) රෝග අවධානමකට ලක්ව සිටින සතුන් සඳහා කෘත්‍රිම අභිජනන ක්‍රම භාවිතා කිරීම,

(iv) අවදානම් සතුන් භාවිතා කොට ගෙන සජීවී සත්ත්ව වෙළෙඳ පොල පැවැත්වීම, දර්ශන හා තරග පැවැත්වීම,

(v) ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හා රෝග කාරක ද්‍රව්‍ය විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදාහැරීම සහ ඌරු මස්වලින් නිෂ්පාදන සකස් කිරීම,

(vi) අදාළ රෝග හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාධිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යයත් හෝ ජලය සම්බන්ධ කිසිදු ස්ථානයකට දැමීම, *හෝ*

(vii) අදාළ රෝගයන් හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාධිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් වෙනත් සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ රැගෙන යාමට හැකි පරිදි යම් ස්ථානයක දැමීම හෝ ස්ථාන ගත කිරීම.

03. සත්ත්ව රෝග පනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ;

එම පනතේ 3(3) උපවගන්තිය අනුව සහ මෙම නියෝගයේ 2(1) ඡේදයේ තහනම් කරන ලද ක්‍රියා සිදුකිරීම වැළැක්වීම සඳහා ද ඒ වෙනුවෙන් එම පනතේ 13 සහ 14 වගන්තීන්වල සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් බලයලත් නිලධාරීන් ලෙස නම් කරමි.

(i) අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(iii) සියලුම පළාත් අධ්‍යක්ෂකවරුන් - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(iv) විෂයානුබද්ධ විශේෂඥ - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(v) දිස්ත්‍රික් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සියලුම දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරිවරු

(vi) දිස්ත්‍රික්ක භාර පශු විමර්ශන නිලධාරීන්

(vii) සියලුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන්

**කස්තුරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල,**
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2024.10.24 වැනි දිනදීය.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13, ගැටඹේ,
පේරාදෙණිය.

EOG 10 - 0201